# 19 නිර්මල සිතක් පිවිතුරු දිවියක්

ආදිපිතෘ ජාකොබ්ගේ පුත් ජෝසෙප්, පොතිපර්ගේ නිවසේ සේවය කරන කාලයේ දී කඩවසම් තරුණයකු වූ අතර ඔහුට වසඟ වූ පොතිපර්ගේ බිරිඳ ඔහු ව පොළොඹවා ගැනීමට හැකි හැම ප්‍රයත්නයක් ම දැරුවා ය. එයින් ප්‍රතිඵලයක් නොවූයෙන් අවසානයේ කිසිවකු නැති මොහොතක ඔහු ව බලහත්කාරයෙන් අල්ලා ගත් නමුත් ඉන් බේරී ජෝසෙප් පැන ගියේ ය. පොතිපර් ආ විගස ජෝසෙප් ඇයට අතවර කිරීමට උත්සාහ කළ බවට බොරු චෝදනා කළෙන්, පොතිපර් ඔහු ව රජුගේ සිරගෙයි දමන ලදි.

"අයහපත තුළින් යහපත උදා කරන සේක"යි පවසන දෙවි සමිඳාණන් වහන්සේ ජෝසෙප්ගේ මෙම විපත පසු ව මහා ජයග්‍රහණයකට හැර වූ සේක. එයට හේතුව කුමන විපතකට මුහුණ දීමට සිදු වුව ද ජෝසෙප් තුළ තිබූ නිර්දෝශී, පිරිසිදු, නිර්මල දිවි පැවැත්ම රැක ගැනීමට කැපවීම ය.

- ජෝසෙප් පොතිපර්ගේ බිරිඳට එකඟ වූයේ නම් කඩ වන පනත්

**(1) හයවන පනත**

> කාමමිථ්‍යාචාරය නොකරව
> (නික්මයාම 20:14)

**(2) නවවන පනත : පරදුර ආලය නොකරව**

> නුඹේ අසල්වැසියාගේ භාර්යාවට ඇළුම් නොකරව
> (නික්මයාම 20:17)

මෙම පනත් පිළිබඳ ව ශුද්ධ වූ පාවුලු තුමා මෙසේ උගන්වයි.

> "අනාචාරයෙන් පලා යන්න. අන් හැම පාපයක් ම මිනිසා කරන්නේ ශරීරයෙන් බැහැර ය. එහෙත් අනාචාරය කරන්නා තමාගේ ම ශරීරයට විරුද්ධ ව පව් කරයි. ඔබගේ ශරීරය, ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ, ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නහු ද?
> (1 කොරින්ති 6:18-19)

## ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය




19.1 රූපය - ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය

පියාගේ මරණින් පසු මව සමග ගෙදර වගකීම් භාරගත් මරිය ගොරෙත්ති තුමිය තම සහෝදර සහෝදරියන් සමග දෙවියන් වහන්සේට ප්‍රිය මනාප ජීවිතයක් ගත කළා ය. දිනක් ඇය නිවසේ තනි ව සිටිය දී එහි පැමිණි ඇලෙක්සැන්ඩර් ඇය ව පාපයට පොළඹවා ගැනීමට උත්සාහ කළ නමුත් ඇය ඊට විරුද්ධ වූ නිසා, ඔහු ඇයට පිහියෙන් ඇන්නේ ය. මරණයට පෙර සිය මෑණියන් ඇමතූ ඇය මෙසේ පැවසුවා යඃ "අම්මේ, මම පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ ද 'මරණයට පත් වුනත් මම මගේ දේව ජීවිතය නැති කර ගත්තේ නෑ' කියා ජේසුට දුන් පොරොන්දුව ඉටුකළා." මිය යන විට ඇගේ වයස අවුරුදු 12කි.

## මයහීාදව (ව්‍රතශුද්ධිය)

තමන් මෙන් ම අනුන් ද 6 හා 9වන පනත්වලට විරුද්ධ පාපයට නොපොළඹවන අයුරින් කෙලෙස් දමනය කිරීම මයහීාදාව වන්නේ ය. තම හැසිරීමෙන් ද ඇඳුම් පැළඳුමෙන් ද අනුන් ව පාපයට පොළොඹවන්නට පුළුවන. මේ නිසා තමන්ගේ ද අනුන්ගේ ද යහපත සඳහා ඒ සියලු කටයුතුවල දී පරිස්සම් වීම මැනව. මේ පිළිබඳ ව තව දුරටත් කතෝලික සභා ධර්මෝපදේශය මගින් කරන ඉගැන්වීම් විමසා බලමු.

ආත්ම දමනය පිළිබඳ ඉගෙන ගැනීම මයහීාදව ඇතුළත් ය. එය මානව ස්වාධීනත්වය තුළ කරන පුහුණුවකි. මිනිසාට තම ආශාවන් හා හැඟීම් පාලනය කර ගෙන සාන්තභාවය ලබා ගත හැකි ය. නැතහොත් තම ආශාවන් හා හැඟීම්වලට තමා ව පාලනය කිරීමට ඉඩ දී අසතුටට පත්විය හැකි ය. එබැවින් මනා බුද්ධියෙන් හා නිදහස් තෝරා ගැනීමෙන් ක්‍රියා කිරීමට මිනිසා තුළ ඇති ශ්‍රේෂ්ඨත්වය ඔහුට ආරාධනා කරයි. ඇතුළාන්ත පාලනයකින් බාහිර බලවේගයන්ට හා අන්ධ බලවේගයන්ට යටත් නොවිය යුතු ය. මෙලෙස සෑම ආකාරයක ම ආශාවන්ගෙන් මිදීම තුළින් මිනිසාට උදරත්වය ලඟා කර ගත හැකි ය. ප්‍රසාද ස්නාපනීය පොරොන්දුවලට පක්ෂපාත හා විශ්වාසවන්ත වී දුර්පරීක්ෂා ජය ගත හැකි ය. මයහීාදව නමැති යහගුණය උපදින්නේ හික්මවීම නමැති ප්‍රධාන ධර්මගුණයෙනි.

(කතෝලික සභා ධර්මෝපදේශය 2338-2341)

විවාහ ජීවිතය දේව වරප්‍රසාදයකි. විවාහ වූ දෙදෙනකු අතර පවතින ස්වභාවික කායික සම්බන්ධතාව නිදොස් ය. එමගින් ඔවුහු මැවීමේ දේව ක්‍රියාවට සහභාගි වෙති. එහෙත් විවාහයෙන් බැහැර ව එම ක්‍රියාවන්හි නිරත වීම මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය දූෂණය කර ගැනීමක් වන්නේ ය.

ආත්ම දමනය ඇතු ව සිටීමට තරුණයන්ට අවවාද කරන්න. සියල්ලෙහි දී ඔබ ම යහපත් ක්‍රියාවන්හි ආදර්ශයක් වන්න. ඔබ උගන්වන විට අවංක ව ප්‍රතිපත්තිගරුක ව සිටින්න.

(තීතස් 2:6-7)

- කිතුනුවාගේ ඇඳුම විනීත විය යුතු ය.
- හැසිරීම සංවර විය යුතු ය.
- කතාබහ යහපත් විය යුතු ය.
- හැඟීම්වලට වහල් නොවී ජීවත් විය යුතු ය.
- චරිත පාරිශුද්ධය රැකීමේ ආත්ම ශක්තිය තිබිය යුතු ය.

"කාමමිථ්‍යාචාරය නොකරන්න"යි කී බව ඔබ අසා ඇත. එහෙත්, මම ඔබට කියමි. යමෙකු ස්ත්‍රියක දෙස කාමරාගයෙන් බැලූ කෙනෙහි ම ඔහු ඈ සමග සිතින් කාමිථ්‍යාචාරය කර ඇත.

(මතෙව් 5:27-28)

වයස්ගත ස්ත්‍රීන් ද ශුද්ධ ජීවිතයකට ඔබින ලෙස හැසිරෙන, අපහාස නොනගන, මත්පැනට ඇබ්බැහි නො වූ, යහපත් දේ උගන්වන අය විය යුතු ය. මෙසේ විය යුතු වන්නේ, දේව වචනයට අපහාසයක් නොවන පිණිස, සිය පුරුෂයන්ටත්, දරුවන්ටත් ප්‍රේම කරමින් ආත්ම දමනය ඇති, නිර්මල ගෘහණියන් ලෙස, කරුණාවන්ත ව, සිය ස්වාමි පුරුෂයන්ට යටත් ව සිටීමට යෞවන භාර්යාවන් පුහුණු කරවනු පිණිස ය.

(තීතස් 2:3-5)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඉහත පනත අනුව දිවි ගෙවීමට නම්


- විවාහක යුවතිපතිහු පතිවත හා පතිනිවත රැකිය යුත්තෝ ය.
- පවුල් ජීවිතය යාච්ඤාව තුළ ගත කිරීමෙන් පවුලට එල්ලවන අභියෝගවලින් මිදිය හැකි ය.

ප්‍රසාද ස්නාපනය ලැබූ සියල්ලන් ම මයෂ්ඨාදව සඳහා කැඳවා ඇත. කන්ද උඩ දේශනාවේ දී මේ පිළිබඳ ව ද දේශනා කළේ තමන් වහන්සේගේ ම ආදර්ශය පෙරටු කොට ගෙන ය. සැම කිතුනුවෙක් ම මයෂ්ඨාදාව තුළ ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමට ප්‍රසාද ස්නාපනයේ දී පොරොන්දු දී ඇත. මෙවන් ජීවිතයක් ගත කිරීමෙන් දෙව් ආසිරි බහුල ව ලබා ගත හැකි ය. ස්වර්ගීය සැපත හිමි කර ගැනීමට හේතු වේ.

> නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය; ඔව්හු දෙවියන් වහන්සේ දකින්නෝ ය.
>
> (මතෙව් 5:8)

## 6 සහ 9 පනත්වලට විරුද්ධ ක්‍රියා

- විවාහ පොරොන්දු කඩ කිරීම (විවාහ සහකරු හා සහකාරිය ඔවුනොවුන්ට අවිශ්වාසවන්ත වීම)
- ආශාවන්ට ඉඩදීම, ඉන්ද්‍රියන් පිනවීම
- අන් අයගේ ශරීර තම තෘප්තිය වෙනුවෙන් පවරා ගැනීම
- කුඩා ළමුන් කාමුක දේ සඳහා යොමු කිරීම
- කාමාශාවන් ඇතිවන ලෙස ඇඳ පැළඳයාම, නිරුවත ප්‍රදර්ශණය කිරීම, ශරීරය වැසෙන සේ ඇඳුම් නොඇඳීම
- දික්කසාදවීම
- අසභ්‍ය පොත්පත් හා චිත්‍රපට බැලීම, බෙදා හැරීම හා ඊට දයක වීම
- අසභ්‍ය වචන භාවිතය
- අන්තර් ජාලයේ අසභ්‍ය වෙබ් අඩවි නැරඹීම.



19.2 රූපය

යාච්ඤා කරන්න



19.3 රූපය

ශුද්ධ බයිබලය කියවන්න

මර්යාදාව ඇති ව දිවි ගෙවන්නට



19.4 රූපය

දිව්‍ය පූජාවට සහභාගී වන්න



19.5 රූපය

දේව ප්‍රසාද නිධාන ලබා ගන්න

## ක්‍රියාකාරකම

1. ශුද්ධ බයිබලය පෙරළා, පහත පාඨ ඔබේ පොතේ ලියා, මෙනෙහි කරන්න.

නිර්මල ජීවිතයකට ආරාධනා

1 කොරින්ති 6:19

ශුද්ධ වූ මාක් 10:9

1 කොරින්ති 6:15

ගලාති 5:22

ගලාති 5:2425

1 ජොහන් 3:3

තීතස් 2:2

2. දේව වචනය ඇසුරෙන් "නිර්මල සිතක් පිවිතුරු දිවියක්" යන මැයෙන් නිසඳැසක් ලියන්න.

***ජීවිතය සඳහා***

***අසභ්‍ය දේ බැලීම, ඇසීම, අනුකරණය, කථා කිරීම පිටු දකිමු.***